# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,825—1961 දෙසැම්බර් 15 වැනි සිකුරාද—15.12.1961**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**සී 337 වැනි අංකය දරණ ආහාර මිල නියෝගය** — **අතිරේක ආහාර ද්‍රව්‍ය**

**1950 අංක 29 දරණ මිල පාලන පනත**

**නියෝගය**

මිළ (ආහාර) පාලක තැන්පත් රෙජිනෝල්ඩ ලෝරන්ස් ආර්නෝල්ඩා වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මිළ (ආහාර) පාලක වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1961 නොවැම්බර් 10 වෙනි දින අංක 12,746 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1961 නොවැම්බර් 10 වෙනි දින අංක සී 335 දරණ ආහාර මිළ නියෝගය අද සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) තවද, මීට යාකර ඇති උපලේඛනයේ 1වෙනි තීරයේ සඳහන් එක් එක් ද්‍රව්‍යය, තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, කොළඹ නගරයේ නාගරික සීමාවන් ඇතුලත විකිණිය හැකි වැඩිම මිළ මේ දන් පටන් මේ උපලේඛනයේ 2වෙනි සහ 3 වෙනි තීරවල අනුපිළිවෙලින් සඳහන්කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්;

(ආ) උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගණුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙනසේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා "රාත්තල" හෙවත් "රා" යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොගවශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දියයුතු බවද නියම කරමි.

(8) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසිදෙයක ඔතනු ලැබේ නම්, එහි මිළත්, උපලේඛනයේ 2 වෙනි හා 3 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන බවද නියම කරමි.

1961 දෙසැම්බර් 15 වෙනි දින, පෙ. ව. 11.45ට කොළඹදී අත්සන් කරන ලදී.

ආර්. ඇල්. ආර්නෝල්ඩා,
මිළ (ආහාර) පාලක.

## උපලේඛනය

| 1 වැනි තීරය<br>වර්ගය | 2 වැනි තීරය<br>තොග වෙළෙන්දකු විසින් දළබර හොන්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| අැනු (රතුඅැනු සහ චික්බෙලපූර් හැර වෙනත් සියළුම) | 22 50 | 0 25 |
| අර්තාපල් | 24 00 | 0 26 |
| අර්තාපල් (ඉන්දියානු) මෙට්ටුපාලයම් | 31 00 | 0 32 |
| වියලි මිරිස්—සන්නම් I වෙනි ශ්‍රෙණිය | 116 00 | 1 18 |
| එම — සන්නම් II වෙනි ශ්‍රෙණිය | 95 00 | 0 96 |
| එම — මුණ්ඩු I වෙනි ශ්‍රෙණිය | 104 00 | 1 04 |
| එම — මුණ්ඩු II වෙනි ශ්‍රෙණිය | 86 00 | 0 86 |
| එම — සන්ටක | 126 00 | 1 30 |
| එම — ජාවා... | 115 00 | 1 15 |
| සුදුරු | 78 00 | 0 80 |
| කහ | 64 85 | 0 66 |
| කොත්තමල්ලි | 65 00 | 0 65 |
| පියලි නොකළ උලුඳු | 44 75 | 0 45 |
| මුංඇට | 43 75 | 0 44 |
| තෝර පරිප්පු | 30 00 | 0 30 |
| කඩල පරිප්පු | 56 00 | 0 57 |
| චික්පීස් | 46 00 | 0 46 |
| සුදුඅැනු (බොම්බෙ) | 55 50 | 0 64 |
| සියඹලා | 43 00 | 0 50 |

සැලකිය යුතුය.—මෙ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. එම මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

12–1069

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි